# නාට්‍යානුසාරයෙන් විද්‍යාව සන්නිවේදනය

**සී. වරකාදෙණිය**

නාට්‍ය හා රංගනය එකිනෙකට බැඳී ඇති, වින්දනාත්මක අත්දැකීම් ලබා දෙන, ජන හදට සමීප වූ මාධ්‍ය වේ. එබැවින් "විද්‍යාව විශේෂිත වූ අයට පමණක්ය" යන්න වෙනුවට "සැමට විද්‍යාව" යන්න ජනතාව අතරට ගෙන යා හැකි ප්‍රබලම සන්නිවේදන මාධ්‍යය නාට්‍ය බව අවිවාදයෙන්ම පිළිගත යුතුව ඇත.

සොබාදහම සමග ජීවත් වූ ආදිකාලීන මිනිසාගේ රංගනය මිථ්‍යා මත හා පදනම් වූ යකුන්, ප්‍රේතයින්, දෙවියන් ආදීන් පිදීමට පමණක් සීමා විය. පසුව බිහිවූ නාඩගම්, කෝලම්, වෙස් නැටුම් යනාදිය ප්‍රේක්ෂකයන්ට වින්දනාත්මක අත්දැකීම් ලබා දීමට සමත් විය. ජාතක කතා සමග ඉදිරියට ආ නාට්‍ය කලාව තුළින් බිහිවූ කුස පබාවතී, සිංහබාහු, කද වළලු, මනමේ වැනි නාට්‍ය සඳහා අද ද ප්‍රබල ඉල්ලුමක් ඇත. වේදිකා නාට්‍ය, වීදි නාට්‍ය, එළිමහන් රංගන, ටෙලි නාට්‍ය ආදී කුමන අයුරකින් ඉදිරිපත් වුවත් මිනිසාට වින්දනය හා දැනුම ලබා දෙන ප්‍රබලම මාධ්‍යය ලෙස ඉදිරියෙන්ම සිටින්නේ නාට්‍යයයි.

සන්නිවේදනය සඳහා නාට්‍යය යොදා ගැනීම තුළින් විද්‍යාව අර්ථවත් හා රසවත් ලෙස ප්‍රචලිත කළ හැක. මෙහිදී පළමුව පොදු ජාතික අරමුණු හා එම අරමුණු කරා යොමු කිරීමට අවශ්‍ය අධ්‍යාපනයෙන් අපේක්ෂිත නිපුණතා හොඳින් දැන ගත යුතුය. එසේම "පාසැල් විෂය මාලාව" එම නිපුණතා ලබා දීම සඳහා සකස් කොට ඇති මෙවලම් බවද අමතක නොකළ යුතුය.

අධ්‍යාපන පරමාර්ථ රටින් රටට වෙනස් වුවත් පොදු පරමාර්ථය වනුයේ යහපත් පුරවැසියෙකු බිහි කර ගැනීමයි. කාල්මාක්ස්ගේ දර්ශනය අනුව එය "කොමියුනිස්ට් සමාජයක් කරා යනු සමාජවාදී මිනිසෙකු බිහි කිරීම" විය. ඇමරිකාවේ එය "විද්‍යාව හා තාක්ෂණ දියුණුව උපරිම ලබන කිසිම අයෙකුට දෙවැනි නොවන ප්‍රජාතන්ත්‍රවාදී මිනිසකු බිහි කිරීම" විය. එම පරමාර්ථ ඉටු වන පරිදි පන්ති කාමරවල විෂයයන් ඉගැන්වීම නිසා තම රටට අවශ්‍ය පුරවැසියන් බිහි කර ගැනීමෙන් එම රටවල් සංවර්ධනය වී ඇත. මහජන චීනයේ "රතු විශේෂඥයෙකු බිහි කිරීම" යන අධ්‍යාපන පරමාර්ථය බුද්ධිමතුන් වූ වැඩ කරන්නන් සහ වැඩ කරන්නා වූ බුද්ධිමතුන් බිහිකිරීමට සමත් වී ඇත.

අප රටෙහි එවැනි පොදු නිශ්චිත පරමාර්ථයක් නැති විය. පන්ති කාමරවල ක්‍රියාත්මක වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය රටෙහි ආර්ථික, සමාජීය අවස්ථාවන්ට ගැලපෙන නිර්මාණශීලී පුද්ගලයින් බිහි කිරීමට සමත් නොවිය.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක් තුළ ක්‍රියාත්මක වූ අධ්‍යාපනයේ පරමාර්ථය වූයේ ලෙයින් සහ වර්ණයෙන් ස්වදේශීය වූ ද චින්තනයෙන් හා සදාචාරයෙන් බ්‍රිතාන්‍ය වූ ද පුරවැසියන් බිහි කිරීමයි. එම පරමාර්ථ ඉටුවන පරිදි අධ්‍යාපනය ක්‍රියාත්මක වූ බවට එකල උගත්හු සාක්ෂි දරති. නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ උගතුන්ට වඩා එකල උගතුන් චින්තනයෙන් හා සදාචාරයෙන් ඉදිරියෙන් සිටින බව අකමැත්තෙන් වුවද පිළිගැනීමට සිදු වේ.

අධ්‍යාපන පරමාර්ථ තුළ ශ්‍රේෂ්ඨ දර්ශනිකයන්ගේ හා අධ්‍යාපනඥයින්ගේ චින්තනයන් ගැබ්වී ඇත. **"අධ්‍යාපනය ජීවනයයි. ජීවත්වීමේ ක්‍රියාවලියයි"** යන **ජෝන් ඩුවීගේ** සංකල්පය හෝ **"හිස, අත, හදවත, යන තුනම අධ්‍යාපනයෙන් සංවර්ධනය විය යුතුයි"** යන **මහත්මා ගාන්ධිගේ** චින්තනය හෝ මෙතෙක් ක්‍රියාත්මක වූ අධ්‍යාපනය තුළ ගැබ්වී නැත. ජීවත්වීමේ ක්‍රියාවලිය නොදන්නා හිස පමණක් සංවර්ධනය වූ උගතුන් අප රට තුළ බහුලවී ඇත්තේ එහෙයිනි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කීප වරක් සිදු වුවද අප රට තුළ සම්ප්‍රදායික විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය එලෙසම ක්‍රියාත්මක වේ. ප්‍රසිද්ධ විභාග වලින් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගන්නා අයට ජනප්‍රිය පාසැල් වලට ඇතුළු වීම, ශිෂ්‍යත්ව දිනා ගැනීම, විශ්ව විද්‍යාලවලට ඇතුළු වීම, වාසිදායක රැකියා ලබා ගැනීම වැනි අවස්ථා උදාවීම එයට හේතුවයි.

නව අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ තුළින් ඉදිරිපත් කර ඇති පොදු අරමුණු කරා යොමු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීමට පාසැල් පද්ධතිය සමත් වේ නම්, විභාග කේන්ද්‍රීය

අධ්‍යාපනය නිසාම පැන නැගී ඇති විරැකියාව, උපාධිධාරීන්ගේ ප්‍රශ්න, තරුණ අසහනය වැනි ගැටළු යම් තරමකින් හෝ අඩු කළ හැකිය. එසේ වීමට නම් ගුරුවරුන් තුළ මෙන්ම, ප්‍රජාව තුළ ද ආකල්පමය වෙනසක් ඇති කළ යුතුවේ. නැතහොත් ඇගයීම්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් යන සියල්ල එල රහිත වනු ඇත.

**ඩෙලෝ** වාර්තාවෙහි සඳහන් පරිදි අධ්‍යාපනය දරා සිටින "ප්‍රධාන කුළුණු හතර" මෙසේ දැක්වෙයි.

- i දැනගැනීමට ඉගෙනීම
- ii වැඩ කිරීමට ඉගෙනීම
- iii එක්ව ජීවත්වීමට ඉගෙනීම
- iv ඉගෙනුමට ඉගෙනීම

විශ්ව අධ්‍යාපන අරමුණු වන මේවා ඉටුවන ලෙස සෑම රටකම අධ්‍යාපන ක්‍රමය සකස් කොට ඇත.

**"පූර්ණ මිනිසකු බිහි කිරීමේ අධ්‍යාශයෙන් කෙරෙන ශාරීරික, බුද්ධිමය, භාවාත්මක හා ගුණාත්මක සංකලනය අධ්‍යාපනයයි"** යන ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන පරමාර්ථ තුළ පූර්ණ මිනිසකු වීම සඳහා සංවර්ධනය විය යුතු අංශ ලෙස පහත සඳහන් හය පෙන්වා දී ඇත.

- i චිත්ත වේග
- ii සදාචාරාත්මක
- iii සමාජමය
- iv බුද්ධිමය
- v ශාරීරික
- vi සෞන්දර්යාත්මක

ඒ සඳහා ලබාදිය යුතු නිපුණතා ලෙස

1. සන්නිවේදනය - සාක්ෂරතාව, කල්පනා කිරීම , සවන්දීම, කථනය, කියවීම, ලිවීම

   ගණනය හා මානනය, ඉලක්කම් භාවිතය, අවකාශය, කාලය, ගණන් බැලීම

   රූපණය, චිත්‍ර, ප්‍රස්ථාර

2. පරිසරයට අදළ - සමාජීය, ජීව විද්‍යාත්මක, භෞතික සම්බන්ධ ආකල්ප හා කුසලතා

3. ආගම, ආචාර ධර්මවලට අදල සදාචාර වර්ධනය

4. ක්‍රීඩා හා විවේකය, සහයෝගය, කණ්ඩායම් එකතුව, සාධාරණ තරගය, ව්‍යායාම

5. ඉගෙනුමට - ඉගෙනීම
   යමක් ගැන දැන ගැනීමට හා දැනුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය වේ.

උසස් පෙළ ඉගෙනුම ලබන්නෝ නව යෞවන වියෙහි සිටුහු වෙති. සුරක්‍ෂිත බව, ස්වාධීනත්වය, කණ්ඩායම් ලැදියාව, ලිංගික ලැදියාව, ආදරය, පිළිගැනීම ට ලක්වීම වැනි අවශ්‍යතා ඔවුනට ඇත. විශේෂයෙන්ම විද්‍යාව හදරන සිසුන් තුළ සැඟවී ඇති සහජ හැකියාව තුළින් නව නිර්මාණයන් රටට ඉදිරිපත් කළ හැක. එයට අවස්ථා සලසා දීම මගින් යොවුන් අවශ්‍යතා තමාටත් රටටත් හිතකර බලවේග බවට පත් කළ හැකිය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් නිර්දේශිත ව්‍යාපෘති හා පැවරුම් මගින් මෙයට අවස්ථා සම්පාදනය කොට ඇත.

එම ව්‍යාපෘති හා පැවරුම් අතරට කේවළ ව්‍යාපෘතියක් ලෙස විද්‍යා නාට්‍ය පිටපතක් ලිවීමද, කණ්ඩායම් ව්‍යාපෘතියක් ලෙස නාට්‍යයක් ඉදිරිපත් කිරීමද ඇතුලත් කළහොත් නිපුණතා ලබා ගැනීමට අවශ්‍ය කුසළතා, දැනුම, ආකල්ප, වර්ධනය වේ. නාට්‍ය කලාව කෙරේ ලැදියාවක් දක්වන්නන් එම ව්‍යාපෘතිය තෝරා ගන්නා බැවින් ස්වයං පෙළඹීම තුළින් විෂය කරුණු වැඩිදුරටත් හදරයි. විවිධ මාධ්‍ය වලින් තොරතුරු ලබා ගනී. පරිකල්පනය හා නිර්මාණාත්මක හැකියාව වර්ධනය කරගනී.




**1 - රූපය**

නාට්‍යයක් ප්‍රේක්‍ෂකයන්ට ඉදිරිපත් කිරීමේ දී

- i කණ්ඩායම් එකතුවීම සිදුවේ
- ii සාමූහිකව පිටපත් කියවයි, සැලසුම් කරයි

iii සහජ හැකියාව අනුව චරිත බෙදා ගනී
iv විවේක කාල වල පුහුණු වෙයි
v බාහිර උදව් ලබා ගනී
vi විවේචන හා අන්‍ය අදහස් ගරු කරයි
vii සමාජය දෙස සුභවාදීව බලයි
viii ප්‍රේක්ෂකයින්ට ඉහළම නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

12.13 ශ්‍රේණිවල සිසුන්ගේ ව්‍යාපෘති තුළින් ඉටු වේ යයි අපේක්ෂිත අරමුණු අතරින් පහත සඳහන් ඒවා "නාට්‍යානුසාරයෙන් විද්‍යාව සන්නිවේදනය" ව්‍යාපෘතියට කෙළින්ම සම්බන්ධ වේ.

1. ලබාගත් දැනුම, කුසලතා භාවිතා කිරීමේ හැකියාව
2. ජීවිතයට අදාළ එලදායී ආකල්ප වැඩි දියුණු කිරීම
3. අන්‍ය අදහස් වලට සැලකීම, ගරු කිරීම
4. තම දැනුම් අත්දැකීම්, අදහස් අන් අයට තේරුම් ගත හැකි වන සේ පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව

13 ශ්‍රේණියෙන් පසු ශිෂ්‍යයා සමාජයට පා තබන පුරවැසියෙක් වේ. ඔහු ලත් නිපුණතා මගින් විද්‍යාත්මක චින්තනය සමාජයට ද සම්ප්‍රේෂණය වේ.

විද්‍යාව සන්නිවේදනයට සම්පූර්ණ නාට්‍ය සෑදීම අවශ්‍ය නැත. ඒ සඳහා පහත සඳහන් අවශ්‍යතා යොදා ගත හැක.




2 - රූපය

i **චරිතාංග රංගන** - ශාකයක්, සතෙක්, ශරීරයක කොටසක් වැනි දෙයකට ආරෝපණය වී විෂය කරුණු ඉදිරිපත් කිරීම.

ii **දෙබස්** - දෙබස් රසවත්ව ඉදිරිපත් කිරීම මගින් විෂය කරුණු ඉස්මතු කිරීම

iii **විකට ජවනිකා** - මූල ද්‍රව්‍ය එකතුවී සංයෝග සෑදීම, වාද විවාද මගින් සංකල්ප මතු කිරීම

iv **නිර්මාණාත්මක නාට්‍ය** - නාට්‍යයක් නිර්මාණය කොට පිටපත් මගින් පුහුණු කරවා ඉදිරිපත් කරන නාට්‍ය (සෞන්දර්යාත්මකව)

උසස් පෙළ ව්‍යාපෘති සඳහා "විද්‍යාව සන්නිවේදනයට නාට්‍ය" යොදා ගන්නේ නම් ඒ සඳහා යෝග්‍ය වන්නේ නිර්මාණාත්මක නාට්‍ය වේ. අනිත් ඒවා නාට්‍යානුසාර ක්‍රියාකාරකම්ය.

විෂය දැනුම තහවුරු කෙරෙන, විද්‍යාව ජීවිතයට සමීප කරන, ස්වයං ඉගෙනීමක් කරා යොමු කෙරෙන, ඉහත ව්‍යාපෘතියක් තුළින් සබකෝලය, හීනමානය, අධිමානය, සමාජ භීතිකාව වැනි චිත්තවේග ජය ගත හැක. හිතකර චිත්තවේග වර්ධනය කරගත හැක. එබැවින් සමාජය දෙස සුභවාදීව බැලිය හැකි යහපත් පුරවැසියන් බිහිවේ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් අපේක්ෂිත රටේ සංවර්ධනයට ක්‍රියාශීලී දායකත්වයක් සැපයිය හැකි ජාතිය ගොඩනැංවීමේ කාර්යයට ඇපකැප විය හැකි පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියන් බිහි කිරීමට ඉහත ව්‍යාපෘතිය දායක වේ. එවිට ඇතැම් උගතුන් අතර පවා පවතින අල්ලස, දූෂණය, වංචාව වැනි අහිතකර බලවේග අඩු වනු ඇත. උසස් අධ්‍යාපන ආයතනවල සිදුවන අමානුෂික නවක වධ වැනි ක්‍රියා ද අවම වනු ඇත. විද්‍යාත්මක චින්තනයකින් යුතුව සුභවාදීව සමාජය දෙස බලන පුරවැසියන් සිටින රටක් සංවර්ධනය කරා යොමු වීම නිතැතින්ම සිදුවනු ඇත.